සුවෙන් පෙරට
**e ඉගෙනුම් පියස**
**මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය**

කලාප අධ්‍යාපන කාර්යාලය - මිනුවන්ගොඩ
மண்டல கல்வி அலுவலகம் - மினுவாங்கொட
Zonal Education Office - Minuwangoda

| වාරය - 2 | | |
|---|---|---|
| ශ්‍රේණිය : 10 | විෂයය : සිංහල සාහිත්‍ය රසාස්වාදය | පාඩම : ( 6 )සිංහල ජන කවිය |

ජන කවිය යනු ගැමියන් අතර පහළ වී ගැමියන් අතර ව්‍යවහාර වූ කාව්‍ය විශේෂයකිජන කවිය අයත් වන්නේ ජනශ්‍රැතිය යන නමින් හඳුන්වනු ලබන සාහිත්‍ය විශේෂයට ය. කිසියම් රටක ජීවත් වූ පොදු ජනතාව අතර කාලයක් මුළුල්ලේ මුඛ පරම්පරාගතව පැවත ආ ජන විශ්වාස ජනකතා යනාදිය ජනශ්‍රැති යන නමින් පොදුවේ හඳුන්වනු ලැබේ. එබැවින් ජන කවිය ජනශ්‍රැතියේ ම අංගයක් සේ සැළකේ. දුරාතීතයේ පටන්ම සම්භාව්‍ය සාහිත්‍යයත් මෙන්ම ජන සාහිත්‍යයක් ද අප අතර තිබූ බව සාහිත්‍ය ඉතිහාසය විමසීමෙන් අවබෝධ කරගත හැකි වේ. කර්තෘ ආඥාත වීම හා ලේඛනාරූඪ වී නොතිබීම ජන කවියෙහි කැපී පෙනෙන ලක්ෂණයකි. ජන කවිය සරළ ය. සංක්ෂප්තය, වියරණ නොතකන සාහිත්‍යය අංගයකි.

* ජනකවියට පබැඳුණු තේමාවන් මොනවා ද ?

උදාහරණ :- ජීවිතයේ විවිධ අවස්ථා

රැකීරක්ෂා

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

* ජන කවි වල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ මොනවාද ?

( ජන කවිය ඊට අනන්‍ය වූ ලක්ෂණ වලින් යුක්තය)

උදාහරණ :- ජන කවිය සරල ය.

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

-----------------------------------------------------------------------------------

* මෙම කවි පන්තියට  අදාළ ගැමි ජීවන වෘත්තීන් හා බැඳුණු   අත්දැකීම් මොනවාද ?

උදාහරණ  : - රන් රිදී කර්මාන්තය

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

* පසු කාලීනව රචනා වූ  ජන කාව්‍ය කිහිපයක් නම් කරන්න.

උදාහරණ  :- යශෝදරාවත

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

---------------------------------------------------------------------------------------

* මෑත කාලයේ ජන කවි රචනා කළ අය කවුරුන්ද ?

උදාහරණ :- ලෙව්කේ මැතිඳු

-------------------------------------------

-------------------------------------------

-------------------------------------------

-------------------------------------------

**01.** **පහත සඳහන් කාව්‍ය අලංකාර වලට ගැලපෙන කවි පදය තෝරන්න.**

| **කාව්‍යාලංකාරය** | **කවි පාදය** |
|---|---|
| < අනුප්‍රාසය | < බඩගිනියි වෙලා මා ගිය කල පුතුගෙ ගෙට<br>මැනලා වී දෙකක් දුන්නයි මල්ලකට |
| < ව්‍යංගාර්ථය | < දොඩම් කපාලා ඇඹුල් තනාලා<br>නාන්න යන හැටි බලන් කලූ |
| < එළිසමය | < බෝඹු ඉදල දලු ලා දෝ නොලාදෝ<br>කෙකටිය මලේ වක යාදෝ නොයාදෝ |
| < කරුණා රසය | < රිදියෙන් තනලා රත්රං ඔබලා<br>කැරලි කෙටුවයි දැකැත්තේ |
| < උපමා | < ලත් පමණට මැටි ඉදි කරවාගෙන<br>පත් බැඳලා කලගෙඩි තනවා ගෙන |
| < සැහැලි | < දුනුකේ මල් සේ උළු ගෙයි ඇඳ පිට<br>ඔලිඳ කෙළන සැටි බලන් කලූ |
| <අතිශයෝක්තිය | <හිමියෙක් නැති ගමන් තනිමග කිමද නගෝ<br>අම්බලම ඉඳලා අපි යමු ද නගෝ |
| < කතා ව්‍යවහාරය | < ඉරට ඉරක් නැත මෙහෙම ඉරක් නැත<br>ඉරිදාට පායන ඉර වාගේ |

**02.** **පහත සඳහන් ප්‍රකාශ අතුරෙන් ජනකවි පිළිබඳව කියවෙන නිවැරදි ප්‍රකාශය තෝරා ලියන්න**

* ජන කාව්‍ය මුඛ පරම්පරාගතව පැවත එයි . / ජනකවි ලේඛකයන් විසින් රචනා කොට ඇත

* ජන කවි අව්‍යාජය. / ජන කවිවල මවාගත් ලෝකයක් විස්තර කරයි.

* ජනකවි නාගරික දිවිපෙවෙත විස්තර කරයි. / ජන කවි ගැමි දිවිපෙවෙත විස්තර කරයි.

* ජනකවිය සරල ය , / ජනකවිය සංකීර්ණය.

* ජනකවිය අතිශයෝක්තියෙන් යුක්ත ය. / ජන කවිය සංක්ෂිප්ත ය.

* ජන කවිවල ධ්වනිතාර්ථවත් පද ඇත ./ ජන කවිවල ධ්වනිතාර්ථවත් පද නැත.

* ජනකවි වල විද්වත් බසක් ඇත. / ජන කවිවල සරල බසක් ඇත.

**03.දී ඇති කොටස් කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න**

1. " බෝඹු ඉදල දලු ලා     දෝ                    නොලාදෝ.

   කෙකටිය මලේ වක යා දෝ               නොයාදෝ ."

   -------------------------------------------------------------------

   -------------------------------------------------------------------

( අ ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න

( ආ) මෙහි  කියවෙන පුද්ගලයා කවුරුන් පිළිබඳ දෙගිඩියාවෙන් පසු වේද?

   -------------------------------------------------------------------

02. "දොඩම් කපාලා ඇඹුල් තනාලා  නාන්න යන සැටි බලන්          කලූ

   සෙලේ ඇඳලා නෙරිය තියාලා   මිදුලේ  සක්මන් කරයි               කලූ

   දහසක් දීලා වළලු තනාලා දැතේ අතලා බලයි                        කලූ

   දුනුකේ මල් සේ උන්නු ගෙයි ඇඳ පිට ඔලිඳ කෙළින සැටි බලන්  කලූ "

(අ)  ඉහත කවියේ උපමාවක් සොයා ලියන්න

   -------------------------------------------------------------------------------------------

(ආ) සිව්පද විරිත වෙනුවට කවියා මෙහිදී යොදාගෙන ඇත්තේ ?

   -------------------------------------------------------------------------------------------

03. "ලත් පමණට මැටි ඉදි       කරවාගෙන

පත් බැඳලා කළගෙඩි තනවා       ගෙන

----- ---------------------------------------------------

----- ---------------------------------------------------"

(අ) ඉහත කවියේ ඉතිරි පද සම්පූර්ණ කරන්න

(ආ) මෙම කවියෙන් කුමන කර්මාන්තයක් පිළිබඳ කියැවේ ද ?

-------------------------------------------------------------

(ඇ) මෙහි කැපී පෙනෙන කාව්‍යාලංකාරය කුමක්ද ?

-------------------------------------------------------------

**04. පහත සඳහන් ප්‍රශ්න වලට උදාහරණ 3 බැගින් ලබා දෙමින් වචන 150 කට නොඅඩු විචාර ලියන්න**

1. ගැමි ජීවන වෘත්තීන් හා බැඳුණු අත්දැකීම් ජන කවියා වස්තු විෂය කරගත් ආකාරය නිර්දිෂ්ට ජනකවි ඇසුරින් පහදන්න

2. ජනකවි සඳහා භාවිත කරන භාෂාව පිළිබඳ පෙළ පොතට අදාළ කවි පන්ති ඇසුරින් විමසන්න

3. පොදු ජන ජීවිතය මැනවින් නිරූපණය කිරීම ජන කවියේ විශේෂ ලක්ෂණයකි. උදාහරණ තුළින් පෙන්වා දෙන්න.

4. සරල උපමා භාවිත කරමින් ජනකවිය ගොඩනැගෙන අවස්ථා ඇත. අදාළ කවි තුනක් ගෙන විමසීමක යෙදෙන්න

5 . විවිධ ජනක්‍රීඩා තුළින් ජනකවි බිහි වීම දක්නට ඇත.

උදාහරණ සහිතව විමසන්න

බප/ මිනු/ දෙවලපොල ආනන්ද ම.වි.

මිනුවන්ගොඩ අධ්‍යාපන කලාපය

ඩබ්.කේ.ඒ.යූ වරුසප්පෙරුම